**ඇකඩමි ඔෆ් ෆයිනෑන්ෂල් ස්ටඩීස් (ඇපයෙන්) සීමිත සමාගම - 2013**

----------------------------------------------------------------------

ඇකඩමි ඔෆ් ෆයිනෑන්ෂල් ස්ටඩීස් (ඇපයෙන්) සීමිත සමාගමේ 2013 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් මාස හතක කාල පරිච්ඡේදය සඳහා වූ මූල්‍ය ක්‍රියාකාරකම් පිළිබඳ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් මාස හතක කාලපරිච්ඡේදය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, සමාගමේ සාංගමික ව්‍යවස්ථාවලියේ 24 ඡේදයේ 4 (බී) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුලත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. විස්තරාත්මක විගණකාධිපති වාර්තාවක් සමාගමේ ප්‍රධාන විධායක නිලධාරී වෙත යථා කාලයේදී නිකුත් කරනු ලැබේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම

-------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන කුඩා හා මධ්‍ය පරිමාණ ආයතන සඳහා වූ ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

--------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැළසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම් වලට උපකාරීවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුලත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරුකිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සමාගමේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 වෙනත් නීතිමය හා ව්‍යවස්ථාපිත අවශ්‍යතාවයන් අනුව වාර්තා කිරීම

----------------------------------------------------------------------

2007 අංක 7 දරන සමාගම් පනතේ 163 (2) වගන්තියේ අවශ්‍යතාවය පරිදි මම පහත සඳහන් පරිදි දන්වා සිටිමි.

(අ) විගණන මතය සඳහා පදනම, විෂය පථය සහ විගණනය සඳහා සීමා කිරීම් පහත දක්වා ඇත.

(ආ) මාගේ අදහස අනුව විගණනය සඳහා අවශ්‍ය සියළුම තොරතුරු හා පැහැදිලි කිරීම් මා විසින් ලබා ගන්නා ලද අතර මාගේ පරීක්ෂණයන්ගෙන් පෙනී යන අන්දමට සමාගම විසින් නිසි පරිදි ගිණුම්කරණ වාර්තා තබා ඇති බවද, සමාගමේ මූල්‍ය ප්‍රකාශන සමාගම් පනතේ 151 වගන්තිය යටතේ වූ අවශ්‍යතාවයන් සමඟ එකඟ වේ.

## 1.5 ඇකඩමි ඔෆ් ෆයිනෑන්ෂල් ස්ටඩීස් (ඇපයෙන්) සීමිත සමාගම පිහිටුවීම

1999 ජුලි 30 දිනැති අංක 99/1386/03/095 දරන අමාත්‍ය මණ්ඩල සංදේශය ප්‍රකාර මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයට අයත් ආයතනවල ගණකාධිකාරී සේවයේ හා ක්‍රමසම්පාදන සේවයේ නිලධාරීන් පුහුණු කිරීම සඳහා රාජ්‍ය ගිණුම් හා මූල්‍ය ආයතනය (INGAF) නමින් ආයතනයක් ස්ථාපිත කර තිබුණි. මෙම ආයතනය 2010 අගෝස්තු 12 දිනැති අංක අමප/10/1773/404/089 දරන අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව මඟින් කළමනාකරණයේ හෝ කාර්යභාරයේ කිසිඳු වෙනසක් සිදු නොකර නාමය පමණක් මිලෝදා (MILODA) ආයතනය ලෙස වෙනස් කර තිබුණි. ඉහත අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව ප්‍රකාර නාමය වෙනස් කර තිබූ රාජ්‍ය ගිණුම් හා මූල්‍ය ආයතනයේ සියළු වත්කම් හා වගකීම් මිලෝදා ආයතනයට පවරා තිබුණ ද මෙම ආයතනය කිසිදු ව්‍යවස්ථාපිත ලිඛිත නීතියක් යටතේ නීතිගත කර නොතිබුණි. ආයතනයේ පැවති රු. 118,351,258 ක වත්කම්වලින් රු. 3,585,477 ක බැරකම් හැරුණු විට ඉතිරි අරමුදල් වූ රු. 114,765,781 ක්, මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය මඟින් මූල්‍යනය කර තිබුණි. මෙම වත්කම්වලින් රු. 14,741,476 ක් වටිනා ගොඩනැගිලි, ඉදිකිරීම් හා අනෙකුත් වත්කම් වෘත්තීය පුහුණු විශ්ව විද්‍යාලයට පවරා මෙතෙක් මිලෝදා ආයතනයේ පැවති ස්ථාවර තැන්පතු රු. 96,500,000 ක්, ලැබිය යුතු පොලී රු.1,617,384 ක්, අතැති මුදල් රු. 1,364,393 ක්, සුළු මුදල් අත්තිකාරම් හා ඉන්ධන අත්තිකාරම් රු. 10,000 ක් සමඟ මුළු වත්කම් රු. 99,491,776 හා රු. 82,289 ක් වූ බැරකම් සමඟ මුළු ශුද්ධ වත්කම් රු. 99,491,776 ක් හා පැරණි රේගු ගොඩනැගිල්ල පිළිසකර කිරීම සඳහා මූල්‍ය කළමනාකරණ ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතියෙන් ලැබී තිබූ රු.151,319,381 ක අරමුදල් යොදා ගෙන 2014 අගෝස්තු 23 දිනැති අංක අමප/12/1129/504/100 දරන අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව ප්‍රකාර 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ 2013 මැයි 17 දින (ඇපයෙන්) සීමිත සමාගමක් ලෙස මෙම ආයතනය නැවත සංස්ථාපනය කර තිබුණි.

මිලෝදා ආයතනය ඇවර කිරීමේදී රු. 1,082,127 ක ස්ථාවර වත්කම්, රු. 210,414 ක සේවක ණය හා රු. 663,590 ක සේවක පාරිතෝෂිත අරමුදල් මෙම සමාගමට පවරන බව දන්වා තිබුණද 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් මාස හතක කාලය සඳහා විගණනය වෙත ඉදිරිපත් කර තිබූ ගිණුම් අනුව එකී වත්කම් හා බැරකම් පවරාගෙන නොතිබුණි.

## 1.6 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

# 2. මූල්‍ය ප්‍රකාශන

## 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2013 දෙසැම්බර් 31 දිනට ඇකඩමි ඔෆ් ෆයිනෑන්ෂල් ස්ටඩීස් (ඇපයෙන්) සීමිත සමාගමේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් මාස හතක කාල පරිච්ඡේදය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය කුඩා හා මධ්‍ය පරිමාණ ආයතන සඳහා වූ ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.2.1 ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති

මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කරනු ලබන කාලයට අදාල ආදායම් හා වියදම් පමණක් ගිණුම්ගත කළ යුතු වුවත් ඊට පටහැනිව 2013 ජනවාරි සිට 2013 මැයි 31 දින දක්වා වූ මුදල් අමාත්‍යාංශයේ පාලන කාල පරිච්ඡේදයට අදාල රු. 1,534,976 ක ආදායම් හා රු. 2,993,234 ක වියදම්ද මූල්‍ය ක්‍රියාකාරකම් වාර්තාව පිළියෙල කිරීමේදී අදාල කර ගෙන තිබුණි.

### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ඇකඩමි ඔෆ් ෆයිනෑන්ෂල් ස්ටඩීස් (ඇපයෙන් සීමිත) සමාගම පිහිටුවීම වෙනුවෙන් පැරණි රේගු ගොඩනැගිල්ල පුනරුත්ථාපනය කිරීම සඳහා මූල්‍ය කළමනාකරණ ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතිය මඟින් ආසියානු සංවර්ධන බැංකු අරමුදලින් රු. 381,970,143 ක් හා දේපල පිරියත හා උපකරණ මිලට ගැනීම සඳහා ශ්‍රී ලංකා රජයේ අරමුදලින් රු. 265,847,007 ක් වැය කර තිබුණි. 2013 දෙසැම්බර් 31 දිනට විගණනය වෙත ඉදිරිපත් කර තිබූ සමාගමේ ගිණුම්වල මෙම වියදම්වලින් දේපල පිරියත හා උපකරණ මිලදී ගැනීම සඳහා ශ්‍රී ලංකා රජයේ අරමුදලින් වැය කර තිබූ රු. 151,319,380 ක් පමණක් ගිණුම්ගත කර තිබුණි. මේ අනුව ගිණුම්වල ආසියානු සංවර්ධන බැංකු අරමුදලින් පැරණි රේගු ගොඩනැගිල්ල පුනරුත්ථාපනය කිරීම සඳහා වැය කර තිබූ රු. 381,976,143 ක් හා ශ්‍රී ලංකා රජයේ අරමුදලින් දේපල පිරියත හා උපකරණ මිලට ගැනීම සඳහා වැය කර තිබූ රු. 114,527,626 ක් ගිණුම්ගත කර නොතිබුණි.

(ආ) එකතුව රු. 90,845,523 ක් වූ පරිගණක හා පුහුණු උපකරණ පිළිවෙළින් අවුරුදු 5 ක සහ අවුරුදු 15 ක ඵලදායී ජීවිත කාලයක් යොදා ගෙන වාර්ෂිකව ක්ෂය ගණනය කිරීම සිදු කර තිබූ නමුත් මෙම වත්කම් මූල්‍ය ප්‍රකාශනවල එකතුවක් ලෙස දක්වා තිබුණි.

### 2.2.3 අනුචිත හෙළිදරව් කිරීම

2014 නොවැම්බර් 28 දිනැති අංක එම්එෆ්6/19/3 දරන නියෝජ්‍ය භාණ්ඩාගාර ලේකම්ගේ ලිපිය ප්‍රකාරව මිලෝදා ආයතනයෙන් සමාගමට පවරා ඇති වත්කම් හා වගකීම් නිරවුල් කළ යුතු ආකාරය දක්වා ඇතත් ඉදිරිපත් කර තිබූ මූල්‍ය ප්‍රකාශනවල එම පැවරූ වත්කම් හා වගකීම් නිරවුල් කර තිබූ ආකාරය පිළිබඳ හෙළිදරව් කර නොතිබුණි.

## 2.3 නීති, රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඒඅයි/2002/2 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය ප්‍රකාරව පිරිවැය රු. 90,850,523 ක් වූ පරිගණක හා පරිගණක උපාංග සම්බන්ධයෙන් ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතිබුණි.

## 3. මූල්‍ය සමාලෝචනය

## 3.1 මූල්‍ය ප්‍රතිඵල

සමාගම 2013 ජූනි 01 දින සිට 2013 දෙසැම්බර් 31 දින දක්වා වූ මාස හතක කාල පරිච්ඡේදය තුල පුහුණු වැඩසටහන්වලින් රු. 22,461,352 ක ආදායමක් සහ පොලී, කුලී සහ ප්‍රදාන මඟින් රු. 18,012,210 ක ආදායමක් එනම් එකතුව රු. 40,473,562 ක් උපයා තිබුණු අතර මෙම කටයුතු සඳහා පුහුණු හා පරිපාලන වියදම් රු. 23,642,969 ක් සහ ක්ෂය සඳහා රු. 9,889,502 ක් වෙන් කිරීමෙන් පසු රු. 6,941,091 ක ශුද්ධ ලාභයක් උපයා ගෙන තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

## 4.1 කාර්යසාධනය

මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ හා එහි විෂය පථයට ඇතුලත් සැලසුම්, ගණකාධිකරණ, බඳුකරණ, තක්සේරු සහ වියදම් කළමනාකරණ ක්ෂේත්‍රයන්වලට සම්බන්ධිත ප්‍රධාන ආයතනයන් හි ඉහළ කලමනාකරණ මට්ටමේ සිට ක්ෂේත්‍ර මෙහෙයුම් මට්ටම දක්වා නියෝජනය වන නිලධාරීන්ගේ දැනුම හා කුසලතා සංවර්ධනය කිරීම මෙම ආයතනය තුළින් ඉටු කර ගැනීමට අපේක්ෂා කර තිබුණ අතර එම අරමුණු ඉටු කර ගැනීමට අදාලව පහත නිරීක්ෂණ ඉදිරිපත් කරමි.

(අ) සමාගම 2013 වර්ෂයේ මාස හතක කාල පරිච්ඡේදය තුළ ඉහත අරමුණ යටතට ගැනෙන පුහුණුවීම් දෙකක් පමණක් පවත්වා තිබුණි. මෙම පුහුණුවීම් සඳහා රු. 6,705,355 ක් වැය කර ඒ සඳහා රු. 18,253,211 ක් මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයෙන් අයකර ගෙන තිබුණි. මෙම පුහුණු වැඩසටහන් යටතේ නිලධාරීන් 328 ක් පුහුණු කර තිබුණි.

(ආ) බාහිර ආයතන සඳහා වැඩසටහන් පැවැත්වීමෙන් රු. 4,208,142 ක ආදායමක් උපයා තිබූ අතර එම වැඩසටහන් සඳහා රු. 1,623,604 ක සෘජු වියදමක් සමාගම විසින් 2013 වර්ෂයේ මාස හතක කාලයක් තුළ දරා තිබුණි. මෙම කාල පරිච්ඡේදය තුළ දරා තිබූ පොදු කාර්ය පිරිවැය මෙම වියදම සඳහා අවශෝෂණය කළ විට පිරිවැය රු. 16,937,617 ක් දක්වා ඉහළ යන බැවින් බාහිර ආයතන සඳහා වැඩසටහන් පැවැත්වීම ආර්ථික වශයෙන් ඵලදායීද යන්න ගැටළු සහගත තත්ත්වයක පැවතුණි.

## 4.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

ගිණුම් කාලපරිච්ඡේදය තුලදී සමාගම විසින් රු. 2,717,366 ක වියදමක් සනීපාරක්ෂක සේවා වෙනුවෙන් දරා තිබූ අතර සනීපාරක්ෂක සේවාව සැපයීමට කොන්ත්‍රාත්තුව ලබා ගෙන තිබූ පෞද්ගලික සමාගම මඟින් දිනකට සේවකයින් 16 දෙනෙකු සේවයේ යෙදවීමට එකඟ වී තිබුණද දිනකට සේවයේ යොදවා තිබූ සාමාන්‍ය සේවක සංඛ්‍යාව 05 ක් පමණි. මහල් 06 කින් යුක්ත ගොඩනැගිල්ලේ රු. 154,226,660 ක වටිනා ස්ථාවර වත්කම් ඇති මෙවැනි සමාගමක පිරිසිදු කිරීමේ කටයුතු සිදු කිරීමට සේවකයින් 05 දෙනෙකු ප්‍රමාණවත් නොවන බව නිරීක්ෂණය විය. එමෙන්ම එක් පිරිසිදු කිරිමේ සේවකයෙකු සඳහා දිනකට රු. 3,000 ක් ගෙවා තිබුණි.

## 4.3 කාර්යමණ්ඩල පරිපාලනය

සමාගමේ 2013 දෙසැම්බර් 31 දිනට කාර්ය මණ්ඩල විස්තර පහත දැක්වේ.

| සේවක වර්ගය | තථ්‍ය සේවක සංඛ්‍යාව | කොන්ත්‍රාත් කාලය (අවුරුදු) | කොන්ත්‍රාත් කාලය තුළ ගෙවන ලද මාසික වැටුප් හා දීමනා |
|---|---|---|---|
| | | | රු. |
| පරිපාලන නිලධාරි | 01 | 01 | 50,000 |
| ගණකාධිකාරි | 01 | 01 | 60,000 |
| පර්යේෂණ සහායක | 01 | අර්ධ කාලීන පදනම මත | 10,000 |
| පරිපාලන සහායක | 02 | 01 | 25,000 |
| තාක්ෂණ සහායක | 03 | 01 | 25,000 |
| කාර්යාල සහායක | 01 | 01 | 25,000 |
| | 09 | | |

පහත සඳහන් නිරික්ෂණ කෙරේ.

(අ) සමාගමේ සේවයේ නියුතු සියළුම සේවකයින් කොන්ත්‍රාත් පදනම මත සේවයේ යොදවා තිබූ බැවින් කොන්ත්‍රාත් සේවකයින්ට මූල්‍ය හා පරිපාලන බලතල පැවරීම ගැටළු සහගත තත්ත්වයක පැවතුණි.

(ආ) 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 9.2 (ඩී) ඡේදය ප්‍රකාර සමාගමේ සංවිධාන සැලැස්ම සහ අනුමත කාර්ය මණ්ඩලය රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කළ යුතු වුවත් එසේ සිදු කර නොතිබුණි.

(ඇ) ඉහත (ආ) හි සඳහන් චක්‍රලේඛයේ 9.3.1 ඡේදය ප්‍රකාර රාජ්‍ය ව්‍යාපාරයක සෑම තනතුරක් සඳහාම බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටි තිබිය යුතු වුවත් මෙම සමාගම විසින් එවැනි පරිපාටි සකස් කර නොතිබුණි.

## 4.4 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

ගිණුම් කාලපරිච්ඡේදය තුළදී සමාගම විසින් පුහුණු වැඩසටහන් 11 ක් පවත්වා නිලධාරීන් 1,662 ක් පුහුණු කර තිබුණි. සමාගම සඳහා දේශන ශාලා 07 ක් ඉදිකර තිබුණු අතර එම දේශන ශාලා තුළ වරකට නිලධාරීන් 884 ක් පුහුණු කළ හැකිව තිබූ බැවින් මෙතරම් ධාරිතාවයෙන් යුතු දේශන ශාලා අඛණ්ඩ වායු සමීකරණ පද්ධතියක් තුල පවත්වාගෙන යාම නිෂ්ක්‍රීය වත්කම් නඩත්තු කිරීමක්ව තිබුණි.

## 5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

## 5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 ඡේදය ප්‍රකාර ආයතනය විසින් කෙටුම්පත් වාර්ෂික මූල්‍ය ප්‍රකාශන මූල්‍ය වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුලත විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත් සමාගම විසින් ගිණුම් ඉදිරිපත් කර තිබුණේ 2014 නොවැම්බර් 07 දිනදීය.

## 5.2 සංයුක්ත සැලැස්ම

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.1.3 ඡේදය ප්‍රකාර සමාගම විසින් අනුමත කරන ලද සංයුක්ත සැලැස්ම ඊලඟ මුදල් වර්ෂය ආරම්භ වීමට අවම වශයෙන් දින 15 කට ප්‍රථම විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, 2014 දෙසැම්බර් 31 දින දක්වාම අලුතින් සංස්ථාපනය කරන ලද මෙම සමාගමේ සංයුක්ත සැලැස්ම විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.

## 5.3 අයවැය ලේඛනමය පාලනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.2 ඡේදය ප්‍රකාරව වාර්ෂික අයවැය සකස් කර, ඊලඟ මුදල් වර්ෂය ආරම්භ වීමට අවම වශයෙන් දින 15 කට ප්‍රථම විගණකාධිපති වෙත පිටපත් එවිය යුතු වුවත් 2014 දෙසැම්බර් 31 දින දක්වාම එසේ කටයුතු කර නොතිබුණි.

(ආ) 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 8.3.6 ඡේදය ප්‍රකාරව වාහන නඩත්තු වියදම්, ඉන්ධන, විදුලි වියදම්, ජල වියදම් සහ ලිපි ද්‍රව්‍ය වියදම්වලට සුදුසු පාලන පද්ධතියක් පවත්වාගෙන යාමේ වගකීම කළමනාකරණය මත රඳා පවතින නමුත් මෙම ආයතනය විසින් විදුලිය වෙනුවෙන් 2013 ජුනි 01 දිනෙන් ආරම්භ වී 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන මාස හතක කාලපරිච්ඡේදය සඳහා රු. 5,799,202 ක වියදමක් දරා තිබුණි. මුළු පරිපාලන වියදමෙන් විදුලි වියදම ප්‍රතිශතයක් ලෙස ගත් විට සියයට 44 ක් විය. මාසික විදුලි වියදමේ සාමාන්‍ය රු. 828,457 ක් විය. ඒ අනුව පෙනී යන්නේ චක්‍රලේඛය ප්‍රකාරව යහපාලන වියදම් පද්ධතියක් විදුලි වියදම වෙනුවෙන් පවත්වා නොතිබුණු බවයි.

(ඇ) 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.3.1 ඡේදය ප්‍රකාරව සමාගමේ මුළු පිරිවැය ඇස්තමේන්තුව සකස් කර නොතිබුණි.

## 5.4 ප්‍රසම්පාදන සැලැස්ම

2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 (ආ) ප්‍රකාරව ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර නොතිබූ අතර ඉදිරිපත් කර තිබූ ප්‍රසම්පාදන කාලසටහන යථෝක්ත මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.2 (අ) සහ (ආ) වගන්ති ප්‍රකාරව සකස් කර නොතිබුණි.

## 6. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන දුර්වලතා සමාගමේ ප්‍රධාන විධායක නිලධාරිගේ අවධානය සඳහා කලින් කල යොමු කරන ලද අතර පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුව තිබුණි.

(අ) මෙහෙයුම් වියදම්
(ආ) අයවැය පාලනය
(ඇ) කාර්යමණ්ඩල බඳවා ගැනීම්